## පළමුවන කියැවීම

ජෝබ් 38:1,8-11

ජෝබ් තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**"නුඹේ එඩිතර රළ පතර මෙහි නවතින්නේය"**

එවිට දෙවිඳුණෝ කුනාටුව මැදින් ජෝබ්ට මෙසේ පිළිතුරු දුන් සේක. "පොළෝ ගැබින් මහ මුහුද බිහි වූ විට දොරටු වසා මුහුදු ජලය නැවැත්වූයේ කවරෙක් ද? මහ මුහුද වලාකුළුවලින් පළඳා, අඳුර නැමති සළුව පෙරවූයේ මම ය. "මේ දක්වා එන්නෙහි ය, මින් එහා නොයන්නෙහි ය. නුඹේ එඩිතර රළ පතර මෙහි නවතින්නේය" කියා කීවේත් මම ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 107:23-26, 28-31

පිළිතුර: සමිඳුණන්ගේ තිර පෙම සදහට ම පවත්නේ ය.

ගීය: සමහරු නැව්වලින් සමුදුර තරණය කරති. මෙලෙස සිය ජීවිකාව සඳහා වෙළඳුම් කරති. ඔව්හු සමිඳුන්ගේ ක්‍රියා ද මුහුද මත එතුමන් කළ අරුම පුදුම දේ ද දකිති.

මන්ද, එතුමාණෝ අණ දෙමින් එහි රළ නංවන චන්ඩ මාරුතය හටගැන්වූ සේක. නැව් අහස උඩට විසි වී ගැඹුරේ පතිත විය. ඒ විපතින් නැවියෝ අධෛර්යයට පත් වූහ.

එවිට ඔව්හු තමන්ගේ විපතේ දී සමිඳුන්ට මොරගැසූහ. එතුමාණෝ ඔවුන්ට පැමිණි විපතින් ඔවුන් මුදා ගත් සේක. එතුමාණෝ කුණාටුව සංසිඳෙවූ සේක. එවිට මුහුදේ රළ නිසලවිය.

නිසලතාවය ඇතිවූ බැවින් ඔව්හු සතුටු වූහ. එතුමාණෝ ඔවුන් අදහස් කළ වරායට ඔවුන් පැමිණෙවූ සේක. සමිඳුන්ගේ තිර පෙම හා මිනිසුන් හට කරන පුදුම ක්‍රියා ගැන මනුෂ්‍යයෝ එතුමන්ට තුති පුදත්වා.

## දෙවන කියැවීම

2 කොරින්ති 5:14-17

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**"සෑම දෙයක්ම නව මැවිලි වනු ඇත."**

'සියල්ලන් උදෙසා එක්කෙනෙකු මළ නිසා, සියල්ලෝ ම මළහ'යි අප නිගමනය කරන බැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි බොහෝ සෙයින් බලපායි. උන් වහන්සේ දිවි පිදුවේ ජීවත් වන්නන් තවත් තමන් ම උදෙසා ජීවත් නොවී, ඔවුන් උදෙසා මැරී, උත්ථාන කරනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත් වන පිණිස ය.

මෙතැන් සිට අපි කිසිවකු ලෞකික මිම්මෙන් නොමනිමු. ලෞකික වශයෙන් අප ක්‍රිස්තුස් වහන්සේ දැන හැඳින සිටියත්, මෙතැන් සිට අපි එලෙස උන් වහන්සේ හඳුනා නොගනිමු. එබැවින් යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහව ගොස් ඇත. දැන් සියල්ලම අලුත් වී තිබේ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** එපේසි 1:17-18

ආලේලූයා! ආලේලූයා!

"සමිඳුණන්ගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක් ද කියා අවබෝධ කර ගැනීමට අපගේ පියාණන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ ප්‍රඥාව හා විදර්ශන ශක්තිය අපට දෙන සේක්වා."

ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 4:35-41

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"සුළඟ ද මුහුද ද කීකරුවන මෙතුමා කවුරුක් ද?"**

එදා සවස් වූ කල, "අපි එගොඩ යමු"යි ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට වදාළ සේක. ඔව්හු සමූහයා පිටත් කර යවා, උන් වහන්සේ ඔරුවේ හුන් ලෙස ම තමන් සමඟ ගෙන ගියෝ ය. ඒ සමඟ තවත් ඔරු තිබිණි. එවිට චණ්ඩ මාරුතයක් හමා, ඔරුව පිරී යන තරමට එයට රළ ගැසීය. උන් වහන්සේ ඔරුවේ අවරයෙහි, මෙත්තය මත නිදා හුන් සේක. ඔව්හු උන් වහන්සේ පුබුදුවා, "ගුරුදේවයෙනි, අප විනාශ වන්න ළඟ ය, ඔබට කිසි ගණනක් නැද්දැ"යි ඇසූ හ. උන් වහන්සේ අවදි ව සුළඟට තර්ජනය කොට, "නිශ්ශබ්ද වෙව, නිශ්චල වෙව"යි මුහුදට අණ කළ සේක. සුළඟ නැවතිණි. මහා නිශ්චලතාවයක් විය. උන් වහන්සේ ද, "ඔබ ඔය තරම් බිය වන්නේ මන් ද? තව ම ඔබට ඇදහිල්ල නැද්දැ"යි ඇසූ සේක. ඔව්හු මහත් භීතියකින් ඇලළී, "මේ කවරෙක් ද? සුළඟ සහ මුහුද පවා උන් වහන්සේට කීකරු වන්නේ ය"යි එකිනෙකාට කී හ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.